විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/උපදෙස් ලිපි අංක 06/2016

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................

දිනය / திகதி / Date } 2016.06.02

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>විදේශ විශ්‍රාමිකයින්ගේ ලිපිගොනු ගෙවීම් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.</u>**

2014 සැප්තැම්බර් මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතිය මධ්‍යගත කිරීම යටතේ සියලුම විශ්‍රාම වැටුප් හා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම මධ්‍යගත දත්ත පද්ධතියක් මඟින් සිදු කරනු ලැබේ. 2014 සැප්තැම්බර් මසට පෙර විදේශ විශ්‍රාම වැටුප් ගෙවන ලද විදේශගත විශ්‍රාමිකයින්ට අදාළ තොරතුරු මධ්‍යගත දත්ත පද්ධතියෙන් තහවුරු කර ගත යුතුව තිබේ.

02. එබැවින් 2014 සැප්තැම්බර් මසට පෙර විදේශගත වූ විශ්‍රාමිකයින් සඳහා හිඟ විශ්‍රාම වැටුප් හා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම අංශයට ලිපි ගොනු යොමු කිරීමේදී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

1. විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප නතර කළ දිනය.
2. විදේශ ගත වූ කාලයේ දී ලංකාවට පැමිණ විශ්‍රාම වැටුප් ලබා ගෙන තිබේ ද යන්න.
3. බැංකු ගිණුම වෙනස් වී ඇත්නම් එම කාල සීමාව හා බැංකුවේ නම.

03. 2014 සැප්තැම්බර් මසට පෙර විදේශගත වී පැමිණි විශ්‍රාමිකයින්ගේ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේදී ඇමුණුම 01 හි ආකෘතියට අනුව ඒ ඒ වර්ෂ වලට අදාළව මාසිකව ගෙවන හෝ නොගෙවන ලද විශ්‍රාම වැටුප පිළිබඳව තහවුරු කර එවීමට කටයුතු කළ යුතුය.

04. අස්ථානගත වූ ලිපි ගොනු සම්බන්ධයෙන් අංක 13/2001 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
02. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
03. විගණකාධිපති - අ.ක.ස.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ඇමුණුම 01

.........................................දින සිට ....................................දින දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම් වාර්තාව.

| වර්ෂය | මාසය | මූලික වැටුප | ජීවන වියදම් දීමනාව | අනිකුත් දීමනා | ගෙවා ඇත | | ගෙවා නැත |
|---|---|---|---|---|---|---|---|
| | | | | | බැංකුවේ නම | බැංකු ගිණුම හෝ වවුචර් පත් අංකය. | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

විවැ/ උපදෙස් ලිපි අංක 6/2016 හි සඳහන් උපදෙස් ප්‍රකාරව ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි

සකස්කළේ :
පරීක්ෂාකළේ :

..............................................
ප්‍රාදේශීය ලේකම්/ගණකාධිකාරී